ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit

| | | | |
|---|---|---|---|
| මගේ අංකය My Number | USJP/BA/EEX15 | ලිපිනය Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල Post Box 10, Gangodawila නුගේගොඩ, ශ්‍රී ලංකා Nugegoda, Sri Lanka , |
| ඔබේ අංකය Your Number | | | |
| දුරකථනය Telephone | 011-3132496, 0115929791, 0115929790 | වෙබ් අඩවිය Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස් Fax | 011-2802753 | විද්‍යුත් තැපැල E-mail | ext.certi@sjp.ac.lk |


2024-02-06

ගරු ස්වාමීන්වහන්ස/ මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනෙවියෙනි

## 2023 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව නම්නීකරණ වැඩසටහන

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ 2023 අධ්‍යයන වර්ෂය සඳහා ඔබව ලියාපදිංචි කරන ලද බව සතුටින් දැනුම් දෙමි.

උක්ත පාඨමාලාවට අදාල නවක සිසුන් දැනුවත් කිරීමේ නම්නීකරණ වැඩසටහන 2024-02-10 වන දින උපකුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විශ්වවිද්‍යාලයීය බණ්ඩාරනායක ශාලාවේදී සැසි 03ක් වශයෙන් පැවැත්වීමට නියමිතය.

**www.external.sjp.ac.lk** යන වෙබ් අඩවියට පිවිස එහි ඔබට නියමිත උපාධි පාඨමාලාව යටතේ ඇති නම්නීකරණ වැඩසටහන 2023 වෙත පිවිස **V අක්ෂරය රහිතව** ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කිරීමෙන් පහත සඳහන් තොරතුරු ඇතුලත් විස්තර පත්‍රිකාව බාගත (Download) කර ගත හැකිය.

1. නම්නීකරණ වැඩසටහන සඳහා සහභාගී විය යුතු දිනය සහ වේලාව
2. නම්නීකරණ වැඩසටහනට සහභාගීවීමේදී ඉදිරිපත් කළ යුතු ඔබගේ ලියාපදිංචි අංකය ඇතුලත් අනන්‍යතා පත්‍රය

## සැලකිලිමත් විය යුතුයි

- නම්නීකරණ වැඩසටහන සඳහා සහභාගී වීමේදී ඔබ විශ්වවිද්‍යාලයට ගැලපෙන විධිමත් ඇඳුමකින් සැරසී පැමිණිය යුතුය.
- ඉහත දැක්වූ පරිදි බාගත කරගත් විස්තර පත්‍රිකාව අනිවාර්යෙන් රැගෙන ආ යුතුය.
- ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු ගමන් බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය රැගෙන ආ යුතුය.
- නියමිත වේලාවට පැය භාගයකට පෙර අදාල ස්ථානයට පැමිණිය යුතුය.
- ඔබට අදාල ගැටලු නිරාකරණය කර දීම සඳහා උපකාරක සේවාවක් එදින පෙ.ව 8.00 සිට ප.ව 5.00 දක්වා අදාල පරිශ්‍රයේදී පැවැත්වේ. ඔබට නියමිත නම්නීකරණ වැඩසටහනට පෙර හෝ පසු එම ස්ථානයේ සිටින නිළධාරීන් හමු වී ගැටලු විසඳාගත හැකිය.
- විමසීම් සඳහා පහත දුරකතන අංක භාවිතා කරන්න.
    - 0112801481
    - 0113132496

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# University of Sri Jayewardenepura
## බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
## External Degrees and Extension Courses Unit

## 2023 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

## මාර්ගෝපදේශ පත්‍රිකාව

- **අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම**

2024 පෙබරවාරි මස සිට උක්ත උපාධි පාඨමාලාවට අදාල අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නියමිත අතර 2026 අවසන් වන විට උපාධි පාඨමාලාව අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ උපාධි I, II සහ III කොටස් සඳහා සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය වන පරිදි විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය විසින් මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ දේශන පවත්වනු ලැබේ.

ප්‍රායෝගික දේශන හැර අනෙකුත් සියලු දේශන මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වනු ලැබේ. එම දේශනවලට සජීවී ලෙස සහභාගී වීම අත්‍යවශ්‍ය වන අතර, පසු භාවිතය සඳහා අදාල පටිගතකල දේශන ඉගෙනුම් කළමනාකරණ පද්ධතියෙහි **(LMS)** අදාල විෂය යටතේ ප්‍රදර්ශනය කරනු ලැබේ. වැඩිදුර විස්තර සඳහා පිවිසෙන්න (learnext.sjp.ac.lk).

## මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දේශන සඳහා ප්‍රවේශවීමේ ක්‍රමවේදය

**Example -** **Username -:** **art202300001** (Registration Number)

**Password -:** NIC - 123456789V (Capital V) / 123456789000

**external.sjp.ac.lk**

↓

**E-Learning**

↓

**Login**

↓

**username /password**

↓

**Faculty of Humanities & Social Sciences (Intakes after 2020)**

↓

**Bachelor of Art (General) External Degree**

↓

**2023 Part I**

❖ **ශිෂ්‍ය වාර්තා පොත**

- ඔබ විසින් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබා අදාල ගෙවීම් කිරීමෙන් පසු ඔබට ලියාපදිංචි අංකයක් සහිත ශිෂ්‍ය වාර්තා පොතක් නිකුත් කරනු ලබන අතර ඉදිරියේදී එය ලියාපදිංචි තැපෑල මඟින් ඔබ ලබා දී ඇති ලිපිනයට එවනු ලැබේ. සිය අධ්‍යයන කටයුතු කරගෙන යාමේදී හා බාහිර උපාධි පාඨමාලා ඒකකය සමග කරනු ලබන සෑම කාර්යයකදීම ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම ශිෂ්‍ය වාර්තා පොතෙහි ඇති ලියාපදිංචි අංකය රාජකාරි ගනුදෙනුවලදී ඉදිරිපත් කරනු ලබන සියලුම ලේඛනයන්හි සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ.

- බාහිර උපාධි අපේක්ෂකයකුගේ ලියාපදිංචිය අවලංගුවන අවස්ථාවකදී ශිෂ්‍ය වාර්තා පොත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ආපසු භාරදිය යුතුය.

- මෙම ශිෂ්‍ය වාර්තා පොත අස්ථානගත වුවහොත් යළි නව ශිෂ්‍ය වාර්තා පොතක් ලබා ගැනීමට නම් අස්ථානගත වූ බවට පොලිස් වාර්තාවක් සමඟ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක් හා අදාල ගෙවීම් සිදු කරනු ලැබූ රිසට්පත සමඟ පාස්පොට් ප්‍රමාණයේ ඡායාරූප 02ක් ඉදිරිපත් කළ යුතුය.

- 09/2021 අංක දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව ඔබගේ උප්පැන්න සහතිකයේ සඳහන් නමට පමණක් ලියාපදිංචිය සිදුකරනු ලැබේ. ශිෂ්‍ය වාර්තා පොතෙහි සහ උපාධි සහතිකයේ සඳහන් කරන්නේ ද එකී නම පමණි. පවත්නා නීති රීති අනුව ලියාපදිංචියෙන් පසුව ඔබගේ නමෙහි යම් සංශෝධනයක් වේ නම් උපාධි III පරීක්ෂණයට පෙර බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත අවශ්‍ය ලේඛන සමග ඉදිරිපත් කළ යුතු වේ. ඉහත චක්‍රලේඛයට අනුව ප්‍රතිඵල වලංගු දිනට පසුව උපාධි අපේක්ෂකයින් නමෙහි සංශෝධනයන් සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- බාහිර උපාධි පාඨමාලා සඳහා ප්‍රථමයෙන්ම අධ්‍යයන වර්ෂ 03ක කාලසීමාවකට ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ. එම නියමිත කාලය තුළ උපාධි පාඨමාලාව අවසන් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයකු තම ලියාපදිංචිය දීර්ඝ කර ගැනීම සඳහා අදාල මුදල් ගෙවා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර කළ යුතුය. මෙවැනි ලියාපදිංචි දීර්ඝ කිරීමේ අවස්ථා 04 ක් හිමි වන අතර එම අවස්ථා 04ත් සමඟ ලියාපදිංචිය වලංගු වන සම්පූර්ණ කාලය අධ්‍යයන වර්ෂ 07 කි. මෙම කාලය තුළ ප්‍රථම වසර පරීක්ෂණ අවස්ථා 07 ක්, දෙවන වසර පරීක්ෂණ අවස්ථා 06 ක් සහ තෙවන වසර පරීක්ෂණ අවස්ථා 05 ක් වශයෙන් විභාග අවස්ථා 18ක් හිමිවේ. ඊට අදාල තොරතුරු www.external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස ලබා ගත හැකිය.

❖ **පාඨමාලා ගාස්තු**

උපාධි I පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර ලියාපදිංචි ගාස්තුව හා පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කර තිබීම අනිවාර්ය වේ. ගෙවීම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අවස්ථාව නොලැබේ.

❖ **ශිෂ්‍ය ලියාපදිංචිය අවලංගු කිරීම**

ඔබ විසින් ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන ලද උසස් පෙළ ප්‍රතිඵල ලේඛනය ඇතුළු ලේඛන අසත්‍ය හෝ ව්‍යාජ ලේඛන බව සනාථ වුවහොත් ඔබගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ. එමෙන්ම ගෙවා ඇති කිසිදු මුදලක් ආපසු නොගෙවනු ලැබේ.

යම් හෙයකින් ඔබගේ ලියාපදිංචිය අවලංගු කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඔබ වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත සමඟ ඉල්ලීම් ලිපියක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර එය සලකා බැලීමෙන් පසු ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.

## ලියාපදිංචිය අවලංගු කිරීමේදී ගාස්තු නැවත ගෙවීම

උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ පසු ලියාපදිංචිය අවලංගු කරන්නේ නම් ඔබ වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත සමඟ ඉල්ලීම් ලිපියක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචිය අවලංගු කිරීමේදී මුදල් නැවත ගෙවීමක් සිදු කරනු ලබන්නේ පහත සඳහන් හේතූන් වලට පමණි.

a) **ලියාපදිංචි වූ දින සිට සති දෙකක් (02) ඇතුළත කරනු ලබන ඉල්ලීම්** සඳහා පමණක් ගෙවන ලද ලියාපදිංචි ගාස්තු හැර (රු.15,000/- නැවත ගෙවනු නොලැබේ) පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන මුදල් ආපසු ගෙවනු ලැබේ. **මෙම කාලසීමාවෙන් පසු පාඨමාලා ගාස්තු නැවත ගෙවන ලෙස කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.**

b) යම් අයකු බාහිර උපාධි පාඨමාලාවකට ලියාපදිංචි වී **ප්‍රථම වසර පරීක්ෂණය පැවැත්වීමට පෙර, රාජ්‍ය විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන් ලියාපදිංචි වුවහොත්** ලියාපදිංචි ගාස්තු හැර (ලියාපදිංචි ගාස්තු රු.15,000/- නැවත ගෙවනු නොලැබේ) පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන මුදල් ආපසු ගෙවනු ලැබේ.

❖ **උපාධි පරීක්ෂණ**

උපාධි I/II සහ III පරීක්ෂණ සඳහා **www.external.sjp.ac.lk** වෙබ් අඩවිය ඔස්සේ අයදුම්පත් කැඳවන අතර මුදල් ගෙවා නියමිත දිනට අයදුම්පත් යොමු කළ යුතුය. ශ්‍රේණි පටිපාටිය සහ ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA), විභාග නිර්ණායක සහ උපාධි ආවශ්‍යකතා, පන්ති සාමර්ථ්‍යය ප්‍රදානය, විභාග අක්‍රමිකතා, උපාධිය වලංගු වන දිනය ආදී සියලු විස්තර **www.external.sjp.ac.lk** වෙබ් අඩවියට පිවිස ඔබට අදාල මානවශස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ බාහිර උපාධි පාඨමාලා විවරණිකාව- 2023 කියවීමෙන් දැනගත හැකිය.

### විශේෂ අවධානය සඳහා

1. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මඟින් පිරිනමන සියලුම බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීමේ සිට උපාධි ප්‍රදානෝත්සවය දක්වා සියලුම කාර්යයන් මෙහෙයවනු ලබන්නේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මඟින් වන අතර ඒ සඳහා වෙනත් කිසිදු බාහිර පාර්ශ්වයකට හෝ ආයතනයකට බලය පවරා නැත. විශ්වවිද්‍යාලයේ අනුදැනුමකින් තොරව වෙනත් පාර්ශ්වයකට හෝ ආයතනයන්ට සිදු කරනු ලබන මුදල් ගෙවීම් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ.

2. ඔබට අදාල මානවශස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ බාහිර උපාධි පාඨමාලා විවරණිකාව - 2023 හි දක්වා ඇති ක්‍රමවේදයන්ගෙන් බැහැරව වෙනත් පාර්ශවයකගේ උපදෙස් මත කටයුතු කිරීම තුළින් උද්ගතවන ගැටලු විසඳා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන අභියාචනා කිසිවක් සැලකිල්ලට නොගන්නා අතර එවාට පිළිතුරු යොමු නොකරන බවද අවධාරණය කරනු ලැබේ.

3. බාහිර උපාධි පාඨමාලා හාදාරන සිසුන් විසින් පිහිටුවා ගනු ලබන සංසද හෝ වෙනත් සංවිධාන සඳහා විශ්වවිද්‍යාලය මඟින් නිල වශයෙන් අවසර ලබා නොදෙන අතර ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් කිසිවක් සලකා බලනු නොලැබේ. විශ්වවිද්‍යාලයේ අවසරයකින් තොරව කිසිඳු ආකාරයේ කටයුත්තක් සඳහා එහි නම සහ නිල ලාංඡනය භාවිත කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

4. මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ බාහිර උපාධි පාඨමාලා විවරණිකාව - 2023 හි සඳහන් ඕනෑම කරුණක් අවශ්‍යතාවය අනුව පූර්ව දැනුම්දීමකින් තොරව සංශෝධනය කිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සතුවේ. යම් සංශෝධනයක් සිදු කළහොත් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ **www.external.sjp.ac.lk** යන වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ.

5. ඔබට ලැබී ඇති විෂයයන් සම්බන්ධයෙන් **www.external.sjp.ac.lk** යන වෙබ් අඩවියෙහි පළ කර ඇති සවිත්රාත්මක විෂය නිර්දේශ පරිශීලනය කිරීමෙන් මනා අවබෝධයක් ලබා ගත හැකිය. විෂයයන් මාරු කිරීමට ලබා දී ඇති කාල සීමාවෙන් පසු කිසිදු හේතුවක් මත නැවත විෂයයන් මාරු කිරීමට අවකාශ නැත.

6. ඔබ නර්තනය හා සංගීතය යන විෂයයන් හදාරන්නේ නම් ඒ සඳහා ප්‍රායෝගික දේශන මාර්ගගත ක්‍රමයට සහ විශ්වවිද්‍යාලය වෙත ගෙන්වා පවත්වනු ලැබේ. **(සැලකිය යුතුයි- නර්තනය විෂයයට අදාළ ප්‍රායෝගික දේශන සඳහා 80% පැමිණීම අනිවාර්ය වේ. එය නර්තනය විෂයට අදාළ පරීක්ෂණ සඳහා පෙනී සිටීමට සුදුසුකමක් ලෙස සැළකේ.)**

7. ඉදිරියේදී ඔබට අදාළ දේශණ ආරම්භ කරනු ලබන අතර සම්මන්ත්‍රණ කාලසටහන වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ. පාඨමාලාවට අදාල වාරික ගෙවීමේ අයදුම්පත්, සම්මන්ත්‍රණ කාලසටහන්, පරීක්ෂණ කාලසටහන්, විභාග ප්‍රවේශ පත්‍ර, ලියාපදිංචිය දීර්ඝ කිරීම සහ උපාධි ප්‍රදානෝත්සවය ආදී සියලු කටයුතු සඳහා දැනුවත් කිරීම් **www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවිය ඔස්සේ පමණක් සිදුකරනු ලැබේ. තැපැල් මඟින් ලිපි එවනු නොලැබේ. එබැවින් නිතර නිතර අපගේ වෙබ් අඩවිය වෙත පිවිස අදාල ශීර්ෂ යටතේ ඇති නිවේදන පිළිබඳ දැනුවත් වන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.**

නියෝජ්‍ය ලේඛකාධිකාරී

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය


ශ්‍රී සුමංගල මන්දිරය
Sri Sumangala Mansion
FACULTY OF HUMANITIES & SOCIAL SCIENCES
NO PARKING



